රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 04/98

මගේ අංකය : ආ/III/3/2
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
1998.01.27 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

## රජයේ නිලධාරීන් ලබා ගන්නා ණය මුදල් සඳහා වූ ලියවිලි අවලංගු කිරීම.

ඔබේ අවධානය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ II වගන්තිය කෙරෙහි යොමු කරනු ලැබේ.

02. ලබා ගන්නා ලද නිවාස දේපල ණය සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමෙන් පසු, එම පරිච්ඡේදයේ 11:15 උප වගන්තියේ විධිවිධාන අනුව අදාල බලපත්‍ර අවලංගු කල යුතු වුවත් ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වුවද, ඇටර්නි බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු ප්‍රමාද වන බව මා වෙත වාර්තා වී ඇත.

03. එබැවින්, නිවාස දේපල ණය ලබා ගෙන ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වූ පසු ඊට අදාල ඇටර්නි බලපත්‍ර අවලංගු කිරීමට වහාම පියවර ගන්නා ලෙස දන්වමි.

අ.කලේ/(ඩික්සන් නිලවීර)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය